අභ්‍යන්තර චක්‍රලේඛ අංක 2017/4

2017/09/21

මගේ අංකය - 1/19/සංචාරක බංගලා
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව,
ඉඩම් මහ ලේකම් කාර්යාලය,නො - 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

01. සියලුම අන්තර් පලාත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් /සහකාර ඉඩම් කොමසාරිස්වරුන්
02. සියලුම සංචාරක බංගලා භාරකරුවන්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අයත් සංචාරක බංගලා විධිමත්ව පවත්වාගෙන යාම,පරිපාලනය හා නඩත්තු කටයුතු

2017.11.01 දින සිට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව සතු සියලුම සංචාරක බංගලාවල කටයුතු පහත පරිදි සංශෝධනයට ලක් කෙරේ.

01. සියලු සංචාරක බංගලා වෙන් කිරීම් ප්‍රධාන කාර්යාලය මඟින් පමණක් සිදු කළ යුතුය.
02. දුරකථනය මඟින් ඉල්ලීම් කර සංචාරක බංගලා වෙන් කිරීමට අවකාශ ඇතද අදාළ ආකෘතියෙන් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර ප්‍රධාන කාර්යාලයට මුදල් ගෙවීමෙන් පසුව පමණක් ලේඛනගත කාමර වෙන් කිරීම සිදුකළ යුතුවේ.
03. සංචාරක බංගලා භාරකරුට කාමර සඳහා අය කරන ගාස්තු ගෙවීමේදී මෙතෙක් අනුගමනය කළ ක්‍රමවේදය අහෝසි කෙරේ.
04. ඇමුණුම 01. යටතේ අමුණා ඇති ලැයිස්තුව ප්‍රකාරව නව සංචාරක බංගලා ගාස්තු අය කෙරේ
05. විධිමත් හා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් නිසි අනුමැතිය ලත් ලිපියක් නොමැතිව කිසිදු විටෙක සංචාරක බංගලාවේ නවාතැන් ලබාදීම සංචාරක බංගලා භාරකරු කටයුතු නොකළ යුතු අතර අදාළ ලිපි නිසි පරිදි ගොනු කර තැබීම ද ඔහු සතු වගකීමකි.
06. සංචාරක බංගලාවල ප්‍රගතිය / ගුණාත්මක තත්ත්වය පිළිබඳ නිරන්තර අධීක්ෂණයක් විෂය භාර නිලධාරීන් විසින් කළ යුතු අතර එහිදී සංචාරක බංගලා නඩත්තුව, පිරිසිදුව තබා ගැනීම, වත්කම් ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ සුහදශීලී බව පිළිබඳ පූර්ණ වශයෙන් අධීක්ෂණය කළයුතු අතර ලොග් සටහන් තැබීමත්, මාර්ගෝපදේශයන් ලබා දීම හා කාර්යක්ෂමව ඉදිරි කටයුතු ඉටු කිරීම අදාළ නිළධාරියා විසින් කළ යුතුය.

07. සංචාරකබංගලා භාරකරු විසින් සෑම නවාතැන් ගැනීමකට අදාළව විධිමත් ආයතනික බිල්පතක් නිකුත් කළ යුතුය.

08. ඇඳ ඇතිරිලි කොට්ට උර, බ්ලැන්කට් ,හා ගෑස් පරිභෝජනය සඳහා ගාස්තු අයකර ලේඛනයක ඇතුළත් කර අදාළ නවාතැන්කරුගේ අත්සන් ලබාගත යුතුය. සංශෝධනය කරන ලද ගාස්තු ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

09. නවාතැන්කරුවන් සංචාරක බංගලාවෙන් පිටවීමට ප්‍රථම සියලු කාමර නාන කාමර පරීක්ෂා කළයුතු අතර යම් හානියක් සිදු වී ඇත්නම් එම නවාතැන් ගත් නිලධාරීන් දැනුවත් කිරීම සංචාරක බංගලා භාරකරු විසින් කළ යුතුය.

**ආර්.එම්.සී.එම්. හේරත්**
ඉඩම් කොමසාරිස් ජනරාල්
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව.

**පිටපත් :-**

01. ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යංශ ලේකම්
02. ඉඩම් කොමසාරිස් (පාලන)
03. සහකාරඉඩම් කොමසාරිස් (පාලන)
04. දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරීන් සහ අංශ ප්‍රධාන නිලධාරීන්
05. ප්‍රධාන අභ්‍යන්තර විගණක
06. අන්තර් ජාලය සඳහා ඉදිරිපත් කිරීමට

## ඉ.කො.ජ. දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා සඳහා ගාස්තු සංශෝධනය

## එක් දිනකදී එක් කාමරයක් සඳහා

| සංචාරක නිවාසය | වෙන් කිරීමේ ස්වභාවය | ඉ.කො.ජ. .දෙපා. නිලධාරීන් සඳහා කාමරයක් එක් දිනකට (රු.) | ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු වල නිලධාරීන් සඳහා කාමරයක් එක් දිනකට (රු.) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා කාමරයක් එක් දිනකට (රු.) | සංස්ථා, අධිකාරී හා ව්‍යවස්ථාපිත මණ්ඩල විශ්‍රාමික නිලධාරීන් සඳහා කාමරයක් එක් දිනකට (රු.) |
|---|---|---|---|---|---|
| කතරගම කාමර අංක 01 | රාජකාරි | 100 | 200 | | |
| | විවේක | 800 | 800 | 800 | 1500 |
| කතරගම කාමර අංක 02, 03 | රාජකාරි | 50 | 100 | | |
| | විවේක | 600 | 600 | 600 | 1000 |
| අනුරාධපුරය | රාජකාරි | 50 | 100 | | |
| | විවේක | 400 | 400 | 400 | 650 |
| පොළොන්නරුව කාමර අංක 01 | රාජකාරි | 150 | 300 | | |
| | විවේක | 2000 | 2000 | 2000 | 3000 |
| පොළොන්නරුව කාමර අංක 02, 03, 04 | රාජකාරි | 100 | 200 | | |
| | විවේක | 1500 | 1500 | 1500 | 2500 |
| හම්බන්තොට | රාජකාරි | 50 | 100 | | |
| | විවේක | 800 | 800 | 800 | 1000 |
| මීපිලිමාන | රාජකාරි | 100 | 200 | | |
| | විවේක | 1500 | 1500 | 1500 | 2500 |
| අම්පාර | රාජකාරි | 50 | 100 | | |
| | විවේක | 700 | 700 | 700 | 800 |
| මහියංගනය | රාජකාරි | 50 | 100 | | |
| | විවේක | 500 | 500 | 500 | 600 |
| මොණරාගල | රාජකාරි | 50 | 100 | | |
| | විවේක | 1000 | 1000 | 1000 | 1500 |

මෙයට අමතරව ඇමුණුම 02 හි ඇතුළත් අයිතමයන් සඳහා . වෙන වෙනම අයකිරීම් ද කරනු ලැබේ.

ඇමුණුම 02

ඉ.කො.ජ. දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලා සඳහා අයකරන ගාස්තුවලට අමතරව

අයකිරීම් ලේඛනය

| අනු අංකය | අයිතමය | අය කරන මුදල |
|---|---|---|
| 01 | ඇඳ ඇතිරිල්ලක් සඳහා | රුපියල් 30 |
| 02 | කොට්ට උරයක් සඳහා | රුපියල් 15 |
| 03 | බ්ලැන්කට් 1ක් සඳහා | රුපියල් 40 |
| 04 | ගෑස් පරිභෝජනය සඳහා | රුපියල් 50 |

# ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

## යටතේ ඇති නිවාඩු නිකේතන වෙන්කර ගැනීම සඳහා අයදුම් පත්‍රය

"අ" ඡේදය

1. අවශ්‍ය නිවාඩු නිකේතනයේ නම :-..............................................................
2. අවශ්‍ය කාල සීමාව :- ........................ දින සිට........................ ...දින දක්වා. රාත්‍රී ගණන......................
3. අයදුම්කරුගේ
   - I. නම :-..............................................................
   - II. ජාතික හැඳුනුම්පත් අංකය :-..............................................................
   - III. දැනට දරන තනතුර :-..............................................................
   - IV. වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය :-..............................................................
   - V. රජයේ සේවයට මුලින් පත් වූ දිනය :-..............................................................
   - VI. මාණ්ඩලික නිලධරයකු නම් එම තනතුරට පත් වූ දිනය :-..............................................................
   - VII. සේවා ස්ථානය :-..............................................................
     ..............................................................
   - VIII. අවසන් වරට නිවාඩු නිකේතනයක් පාවිච්චි කළ දිනය හා නිකේතනයේ නම :-..............................................................
   - IX. සම්බන්ධ කර ගතහැකි දුරකථන අංක :-රාජකාරී.............................. පෞද්ගලික..............................
4. නිවාඩු නිකේතනයේ නවාතැන් ගැනීමට අපේක්ෂිත අය පිළිබඳ විස්තර (වයස අවුරුදු 10ට වැඩි දරුවන් සිටී නම් ඔවුන්ගේ නම ද ඇතුළත් කළ යුතුය.)

| | නම | අයදුම්කරුට ඇති සම්බන්ධය |
|---|---|---|
| I. | ................................................ | .................................... |
| II. | ................................................ | .................................... |
| III. | ................................................ | .................................... |
| IV. | ................................................ | .................................... |
| V. | ................................................ | .................................... |
| VI. | ................................................ | .................................... |
| VII. | ................................................ | .................................... |
| VIII. | ................................................ | .................................... |
| IX. | ................................................ | .................................... |
| X. | ................................................ | .................................... |
| XI. | ................................................ | .................................... |
| XII. | ................................................ | .................................... |
| XIII. | ................................................ | .................................... |
| XIV. | ................................................ | .................................... |

(සම්පූර්ණ සංඛ්‍යාව ......................)

ඉහතින් සඳහන් කළ විස්තර නිවරදි බවත්, මෙහි "ආ" ඡේදය දක්වා ඇති කොන්දේසිවලට එකඟ වන බවත්, නිකේතන භාරකරු වෙතින් නවාතැන් පහසුකම් ලබා ගැනීම සඳහා මා පෞද්ගලිකවම ඉදිරිපත් වන බවත්, මා පෞද්ගලිකව ඉදිරිපත් නොවන්නේ නම් මෙහි ඉහත නම් සඳහන් කිසිදු අයෙකු නිවාඩු නිකේතනයේ නවාතැන් පහසුකම් ඉල්ලා නොයවන බවත් , එම නේවාසිකයන් වෙතින් මෙම නිවාඩු නිකේතනයේ දේපළවලට කිසියම් හානියක් සිදු වුවහොත් ඊට අදාළ අලාභය මාගේ වැටුපෙන් අයකර ගැනීමට එකඟත්වය පළකරන බවත් මෙයින් පොරොන්දු වෙමි.

දිනය ............................

............................................
අයදුම්කරුගේ අත්සන

---

ඉඩම් කොමසාරිස් ජනරාල්

අංක 03 යටතේ I සිට VIII දක්වා සඳහන් විස්තර නිවරදිය. නිවාඩු නිකේතනය වෙන් කිරීම සුදුසු බව නිර්දේශ කරමි.

දිනය :-........................................

............................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා

(නිල මුද්‍රාව තබන්න)

**"ආ" ඡේදය**

මගේ අංකය :- 1/19/

දිනය :- 201

.................................................................................................මයා/මිය/මෙනවිය

.....................................................................................

.......................................................................

පසුපිට විස්තර දක්වා ඇති ........................දෙනාට ....................................දින පෙ.ව. 10.00 සිට .......................දින පෙ.ව. 9.00 දක්වා දින ...................ක් ..........................................නිවාඩු නිකේතනයේ නවාතැන් ගැනීමට අනුමැතිය දෙමි. ඔබ විසින් පහත සඳහන් කොන්දේසි පිළිපැදිය යුතුය.

I. අයදුම්කරු නිවාඩු නිකේතනයේ අනිවාර්යෙන් නවාතැන් ගැනීම කළයුතු අතර නිවාඩු නිකේතනයේ නවාතැන් ගැනීමේදී දෙපාර්තමේන්තුව මඟින් අනුමත කරන ලද අයදුම්පත හා මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත නිකේතන භාරකරු වෙත අනිවාර්යෙන්ම ඉදිරිපත් කළ යුතුය.

II. ජලය අරපිරිමැස්මෙන් පාවිච්චි කළ යුතු අතර, පාවිච්චි කරන ලද රෙදිපිළි සඳහා නියමිත ගාස්තු නිකේතන භාරකරු වෙත ගෙවිය යුතුය.

III. නිකේතන භූමියේ ඇති මල් හා පලතුරු ගස්වලට හානි නොකළ යුතු අතර, මල් කැඩීමෙන්ද වැළකිය යුතුය. තවද, නිකේතන භූමියේ වාසය කරන කාල සීමාව ඇතුළත එහි දේපළවලට හානියක් නොවන පරිදි හැසිරිය යුතුය. එවැනි අලාභයන් සිදුවුවහොත් ඒ සඳහා වටිනාකම ඔබගෙන් අය කිරීමට කටයුතු කරනු ඇත.

IV. මෙම නිකේතනයේ පහසුකම් අනුව රඳවා තබා ගතහැකි උපරිම නේවාසිකයින් සංඛ්‍යාවට අමතරව වැඩිපුර නේවාසිකයන් රැගෙන නොයා යුතුය.

V. මෙම නිකේතනයේ උත්සව හා සම්භාෂණ පැවැත්වීම සම්පූර්ණයෙන්ම තහනම් ය.

VI. නිවාඩු නිකේතනයේ ගත කරන කාලය තුළ සිදුවන යම් අයථා ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔබට විරුද්ධ යම් පැමිණිල්ලක් ලැබුණහොත් ඉදිරියේ දී නිවාඩු නිකේතන වෙන් කිරීම පිළිබඳව ලැබෙන අයදුම්පත් සලකා බලනු නොලැබේ.

VII. වෙන් කරගත් නිවාඩු නිකේතනය භාවිතා නොකරන්නේ නම් ඒ බව වෙන් කරවා ගත් දිනට, වැඩ කරන දින 07කට පෙර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත ලිඛිතව දැන්විය යුතුය. ඒ වෙනුවෙන ඕනෑම හේතුවක් නිසා මුදල් ආපසු නොගෙවන අතර, නොවැළැක්විය හැකි හේතුවක් නිසා වෙන් කරවා ගත් නිවාඩු නිකේතනය භාවිතා නොකරන්නේ නම් පමණක් එම දිනය වෙනුවට අදාළ වර්ෂය ඇතුළත් වීමට පෙර ඉඩ ඇති වෙනත් දිනයක් ලබා දීමට සලකා බලනු ඇත.

VIII. රාජකාරි අවශ්‍යතාවයන් මත කෙටි දැනුම් දීමක් මඟින් මෙම වෙන් කිරීම අවලංගු කළ හැකිය. එවන් අවස්ථාවකදී අය කළ මුදල ආපසු ගෙවනු ලැබේ.

..........................................................................

ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස්(පාලන),
ඉඩම් කොමසාරිස් ජනරාල් වෙනුවට
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

පිටපත්:- 01. නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් /සහකාර ඉඩම් කොමසාරිස් ................................... දැ.ගැ.පි.

02. නිවාඩු නිකේතන භාරකරු -.......................................අ.ක.සඳහා

| සංචාරක බංගලාව | පිහිටීම | දුරකථන අංකය | කාමර සංඛ්‍යාව | උපරිම නේවාසික සංඛ්‍යාව |
|---|---|---|---|---|
| කතරගම | කතරගම සෙල්ලකතරගම පාරේ, 1කි.මී.ක් පමණ ගොස් දකුණට හැරී කිරි වෙහෙරට යාමට ඇති තුන්වන පාලම අසල (ගංගාරාම නිවාඩු නිකේතනය වම්පස) | 047-3487165 | 03 | 10 |
| හම්බන්තොට | හම්බන්තොට සිට මාතර දෙසට ඇති ප්‍රධාන මාර්ගයේ 2කි.මී.ක් යන විට හමුවන රෝහල පාරෙන් මීටර් 200ක් පමණ ගිය පසු | 047-3487166<br>071-2688452 | 05 | 10 |
| අනුරාධපුරය | අනුරාධපුරය පුත්තලම මාර්ගයේ ජයන්ති පාර කඩ 30 පිටුපසපිහිටා ඇත. | 025-2234757 | 03 | 06 |
| පොළොන්නරුව | පොළොන්නරුව ප්‍රධාන නගරයේ සිට නව නගරයට යන පාරේ(පරාක්‍රම සමුද්‍රයට යන පාර) සුදු අරලිය සංචාරක හෝටලය හා | 077-3030650 | 04 | 12 |
| මීපිළිමාන | නුවරඑළිය අඹේවෙල පාරේ කි.මී.4ක් ගියවිට මීපිළිමාන ලංකා බැංකුව සමීපයේ | 077-3030366 | 03 | 09 |
| අඹසාර | උහන පාරේ කි.මී.7ක ගියවිට උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමීපයේ | 077-5162045 | 03 | 06 |
| මහියංගණය | මහියංගණය පාලම පසුකළ පසු තානායමට මී.200ක් ඉදිරියට ගියවිට | | 04 | 08 |
| මොනරාගල | මොනරාගල කච්චේරිය හන්දියේ උඩපාරේ පැමිණ කච්චේරිය ප්‍රධාන පිවිසුමේ සිට මීටර් 50ක් පමණ ගියපසු | 071-7754311 | 03 | 06 |